කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : **01** WW/T/22/04/03/01

වර්ණය : ඇම්බර්

# ප්‍රභල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 අප්‍රේල් මස 03 වන දින ප.ව. 09.00 වන තෙක් වලංගු වන පරිදි
2022 අප්‍රේල් මස 03 වන දින ප.ව. 01.00 ට නිකුත් කරන ලදී.

## විමසිලිමත් වන්න !

බස්නාහිර, මධ්‍යම, සබරගමුව, උතුරු-මැද සහ වයඹ පළාත්වලත් වව්නියාව, මන්නාරම, බදුල්ල සහ ගාල්ල දිස්ත්‍රික්කවලත් තැනින් තැන ගිගුරුම් සහිත වැසි සමග ප්‍රභල අකුණු ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී. මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට **මි.මී. 100** ට වැඩි තද වැසි ද ඇතිවිය හැක.




ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැදී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැදී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්ත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

| | | |
|---|---|---|
| වර්ණය:- රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය:- ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය:- කොළ<br>(බලපෑමක් නැත) |

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.